# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 26 දරන
## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත

---

**[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 ඔක්තෝබර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : 3.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.10 යි.

# 1996 අංක 26 දරන
# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත

[සහතිකය සටහන් කළේ 1996 ඔක්තෝබර් මස 17 වන දින]

එල්. ඩී.-ඕ. 45/95

**බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය යනුවෙන් හඳුන්වනු ලබන විශ්වවිද්‍යාලයක් පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා ද භික්ෂූන් වහන්සේලාට විශ්ව විද්‍යාල මට්ටමේ උසස් අධ්‍යාපනයක් ලබාදීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

බුද්ධශාසනය ආරක්ෂා කර පෝෂණය කිරීම ශ්‍රී ලංකා ජනරජයේ කාර්යය වන හෙයින් සහ බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ජාතික විශ්වවිද්‍යාලයක් වශයෙන් කටයුතු කිරීම සඳහා බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයක් පිහිටුවීම ජාතික වශයෙන් වැදගත් වන හෙයින් ; පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එහි විධිවිධාන සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ දිනවල සිට ක්‍රියාත්මක වන්නේ ය. මේ පනතේ ඒ ඒ කොටස් සඳහා වෙන් වෙන් දිනයන් නියම කරනු ලැබිය හැකි ය. ලුහුඬු නාමය.

## I වන කොටස

### බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

2. (1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය යන නාමය සහ අභිධානය යටතේ ඒකීය සහ නේවාසික විශ්ව විද්‍යාලයක් භික්ෂූන් වහන්සේලා සඳහා පිහිටුවනු ලැබේ. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය පිහිටුවීම.

(2) විශ්වවිද්‍යාලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, එකී නාමයෙන්,—

(i) සියලු අධිකරණවල නඩු පැවරීමේ සහ නඩු පවරනු ලැබීමේ ද ;

(ii) පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ;

(iii) මේ පනතේ කාර්ය සඳහා සහ යම් නියමාවලියකට සහ රීතිවලට යටත්ව, යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීමේ, තෑග්ගක් වශයෙන් හෝ තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන් ආකාරයකින් හෝ අත් කර ගැනීමේ, බද්දට ගැනීමේ හෝ කුලියට ගැනීමේ සහ දැරීමේ ද ;

(iv) එවැනි යම් දේපළක් විකිණීමේ, උකස් කිරීමේ, බද්දටදීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ ද

පූර්ණ බලය සහ අධිකාරය විශ්වවිද්‍යාලයට ඇත්තේ ය :

එසේ වුවද, එවැනි යම් දේපළක් විකිණීමක්, උකස් කිරීමක්, බද්දට දීමක්, හුවමාරුකර ගැනීමක් හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමක්, ඒ දේපළ විශ්වවිද්‍යාලය වෙත පවරා දුන් සාධන පත්‍රයේ අඩංගු යම් සීමාකිරීමක්, කොන්දේසියක් හෝ තහනමක් උල්ලංඝනය කරමින් කරනු ලැබූ විටක, ඒ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරුකර ගැනීම හෝ අන් ආකාරයක නියාදනය කිරීම අවලංගු වන්නේ ය ; තවද

(v) මේ පනතේ යම් විධිවිධානයක් මගින් විශ්වවිද්‍යාලය වෙත පවරා දී හෝ භාර කොට ඇති සියලුම බලතල සහ කාර්ය මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමේ සහ ඉටුකිරීමේ පූර්ණ බලය සහ අධිකාරය විශ්වවිද්‍යාලයට ඇත්තේ ය.

විශ්වවිද්‍යාලයේ පරමාර්ථ.

3. විශ්වවිද්‍යාලයේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි වන්නේ ය :—

(i) බුදුරජාණන්වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම ;

(ii) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර බෞද්ධ භාවනාව පිළිබඳ පුහුණුව සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ;

(iii) ථෙරවාද බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම ;

(iv) බුද්ධ ධර්මය හැදෑරීමට සහ ඒ පිළිබඳව පර්යේෂණ කිරීමට ධෛර්ය දීම ;

(v) බෞද්ධ සංස්කෘතික සහ එහි අගයයන් ප්‍රවර්ධනය කිරීම ; සහ

(vi) ඉහත සඳහන් පරමාර්ථවලට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කවර වුවද දෙයක් කිරීම.

විශ්වවිද්‍යාලයේ බලතල.

4. මේ පනතෙහි විධිවිධානවලට යටත්ව පහත සඳහන් කටයුතු කිරීමට විශ්වවිද්‍යාලයට බලය ඇත්තේ ය :—

(අ) ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තෝරා ඇතුළත් කර ගැනීම හා අනුමත කරන ලද කවර වුවද අධ්‍යයන ක්ෂේත්‍රයක අධ්‍යාපනය ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ආ) පහත සඳහන් විෂයයන්, එනම්, සූත්‍ර, අභිධර්ම, විනය, බෞද්ධ දර්ශනය හා තර්ක ශාස්ත්‍රය, මනෝ විද්‍යාව, පුරා විද්‍යාව, බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය, තුලනාත්මක ආගම්, පෙරදිග හා අපරදිග භාෂා සහ බෞද්ධ අධ්‍යාපනයට අදාළ වෙනත් යම් විෂයයක් ඉගැන්වීමට විධිවිධාන සැලැස්වීම සහ ඒ විෂයයන් අතුරෙන් එක් එක් විෂයය සඳහා හෝ විෂයයන් කීපයක් සඳහා අධ්‍යයන අංශ පිහිටුවීම ;

(ඇ) ධර්මදූත කටයුතු සහ බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම සහ, ඒ කාර්යය සඳහා, විශ්වවිද්‍යාලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ එසේ නිශ්චය කරනු ලබන කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පිහිටි වෙනත් විශ්වවිද්‍යාල හෝ බලමණ්ඩල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඈ) අනුමත කරන ලද අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම ;

(ඉ) විශ්වවිද්‍යාලයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පිහිටි වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ, ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන්, හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියාකිරීම ;

(ඊ) අනුමත කරන ලද පාඨමාලා විශ්වවිද්‍යාලයේ දී හදාරා, අවශ්‍ය වන විශ්වවිද්‍යාලීය විභාගවලින් සාමාර්ථ්‍යය ලැබූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට සහ උන්වහන්සේලා වෙත මේ පනත යටතේ සනාතන සභාව විසින් තීරණය

කරනු ලැබ පාලක සභාව විසින් අනුමත කරන ලද උපාධි, අභිඥාන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පිරිනැමීම ;

(උ) වෙනත් විශ්වවිද්‍යාලවල උපාධිධාරී භික්ෂූන් වහන්සේලා හෝ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, විශ්වවිද්‍යාලයේ ඒ හා සමාන හෝ සමරූප උපාධිවලට සහ අධ්‍යයන පාඨමාලාවලට, අතුරු ව්‍යවස්ථා මගින් නියම කොට ඇති කොන්දේසි මත ඇතුළත් කර ගැනීම සහ, ඔවුන් විශ්වවිද්‍යාලයේ උපාධිධාරී භික්ෂූන් වහන්සේලා හෝ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ලෙස ලියාපදිංචි කිරීම ;

(ඌ) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් නිර්දේශ කරනු ලැබ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන තැනැත්තන්ට සම්මාන උපාධි හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම ;

(එ) අතුරු ව්‍යවස්ථා වලින් හෝ නියෝග මගින් හෝ නියම කර ඇති පරිදි, විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේලා විසින් හෝ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසින් වෙනත් විශ්වවිද්‍යාලවල දී හෝ විශ්වවිද්‍යාල තත්ත්වයේ අධ්‍යාපන ආයතනවලදී සාමාර්ථ්‍යය ලත් විභාග හා ගතකළ අධ්‍යයන කාලසීමා අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාලසීමාවලට හෝ ඉන් යම් කොටසකට හෝ සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(ඒ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල හා ඉගැන්වීමේ හෝ පදිංචිවීමේ කාර්ය සඳහා වූ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ඔ) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්‍ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු, විභාග පරීක්ෂක තනතුරු සහ විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය වන වෙනත් තනතුරු ඇති කිරීම ;

(ඕ) විශ්වවිද්‍යාලයේ සියලුම තනතුරුවලට පත්කිරීම් කිරීම ;

(ක) බෞද්ධ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා පශ්චාත් උපාධි පර්යේෂණවල නියුතු භික්ෂූන් වහන්සේලාට පර්යේෂණ ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, ආධාර ශිෂ්‍යත්ව හා ත්‍යාග හා ප්‍රදාන ඇති කොට ඒවා පිරිනැමීම ;

(ග) විශ්වවිද්‍යාලයේ අරමුණුවලට මුළුමනින්ම හෝ යම් ප්‍රමාණයකට හෝ සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පිහිටි අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමඟ, ඒවායේ පොදු අරමුණුවලට හිතකර වන සහයෝගිතා ඇති කර ගැනීම සඳහා ගිවිසුම්වලට එළඹීම;

(ච) විශ්වවිද්‍යාලයේ නිලධරයන්ගේ, ආචාර්යවරයන්ගේ හෝ සේවකයන්ගේ සහ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ වාසය, විනය හා සදාචාරත්වය, මානසික හා ශාරීරික ශුභ සිද්ධිය විධිමත් කිරීම හා ඒ සඳහා විධිවිධාන සැලැස්වීම :

(ජ) නේවාසිකාගාර පිහිටුවීම සහ පාලනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ වාසය පිණිස අවශ්‍ය වන වෙනත් සේවා සහ පහසුකම් සැලැස්වීම :

(ට) නීතිය මගින් කලින් කල නියම කරනු ලබන ගාස්තු ඉල්ලා සිටීම සහ භාර ගැනීම ; සහ

(ඩ) මේ පනතේ නිශ්චිතව සඳහන් කොට ඇති බලතලවලින් කවරක් වුවද සඵලාත්මකව ක්‍රියාත්මක කිරීම සඳහා සහ 3 වන වගන්තියේ දක්වා ඇති පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

## II වන කොටස

### විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායයන් වහන්සේ සහ මහෝපාධ්‍යායයන් වහන්සේ

මහා මහෝපාධ්‍යායයන් වහන්සේ.

5. (1) පහත සඳහන් මහා නායක හිමිපාණන් වහන්සේලා (i) වන ඡේදයෙහි සඳහන් මහා නායක හිමිපාණන් වහන්සේගෙන් ආරම්භව මාරුවෙන් මාරුවට විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විය යුතු අතර ඒ එක් එක් හිමිපාණන් වහන්සේ විසින් වර්ෂ දෙකක කාලයක් ඒ ධුරය දැරිය යුතු ය :—

(i) ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ ;

(ii) ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ ;

(iii) ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහා නායක හිමිපාණන් වහන්සේ හෝ තත්කාලයෙහි ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපති ධුරය දරන මහා නායක හිමිපාණන් වහන්සේ ;

(iv) ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහා නායක හිමිපාණන් වහන්සේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් මහා නායක හිමිපාණන් වහන්සේ කෙනකු හෝ උත්තරීතර මහා නායක හිමිපාණන් වහන්සේ කෙනකු හෝ විසින් විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායයන් වහන්සේගේ ධුරය භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී බුද්ධ ශාසන විෂයය භාර අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, ඒ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උත්තරීතර මහා නායක හිමිපාණන් වහන්සේ විමසා එම නිකායේම වෙනත් මහා හිමිපාණන් වහන්සේ නමක් විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් නම් කරනු ලැබිය යුතු ය.

(3) මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වන අතර උන්වහන්සේ පැමිණ සිටින විට, විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන උන්වහන්සේ විසින් දැරිය යුතු ය.

(4) මහා මහෝපාධ්‍යාය ධුරය දරන මහා නායක හිමිපාණන් වහන්සේ හෝ මහා හිමිපාණන් වහන්සේ අපවත් වුවහොත් හෝ ධුරය හිස් කළහොත් ඒ මහානායක හිමිපාණන්ගේ හෝ මහා හිමිපාණන් වහන්සේගේ ධුරයට අනුප්‍රාප්ත වන මහා නායක හිමිපාණන් වහන්සේ විසින් හෝ මහා හිමිපාණන් වහන්සේ විසින් හෝ මහා මහෝපාධ්‍යාය ධුර කාලයෙන් තම පූර්වගාමියාගේ නොගෙවී ශේෂවී ඇති ධුර කාලය සඳහා ඒ ධුරය දැරිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ නිලධරයන්.

6. පහත සඳහන් තැනැත්තෝ විශ්වවිද්‍යාලයේ නිලධරයෝ වන්නාහ :—

(i) මහෝපාධ්‍යායයන් වහන්සේ ;

(ii) ලේඛකාධිකාරී ;

(iii) මූල්‍යාධිකාරී ;

(iv) පුස්තකාලයාධිකාරී ; සහ

(v) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ වගන්තියෙහි කාර්ය සඳහා නිලධරයකු බව නියමාවලි මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද එවැනි තනතුරක් දරන තැනැත්තෙක්.

7. (1) (අ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම මහෝපාධ්‍යායයන් වහන්සේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, උන්වහන්සේ පත් කරනු ලැබූ විට ,— මහෝපාධ්‍යායයන් වහන්සේ.

(i) මේ පනතින් උන්වහන්සේ වෙත පවරාදී ඇති හෝ පනවා ඇති හෝ භාරකොට ඇති සියලු බලතල කාර්ය සහ කර්තව්‍ය උන්වහන්සේ විසින් පාවිච්චි කරනු, ඉටු කරනු සහ සිදු කරනු ලැබිය යුතු ය ;

(ii) මේ පනත යටතේ විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල යථා පරිදි සංස්ථාපනය කරනු ලබන තෙක් ඒ බලමණ්ඩල සියල්ලේම හෝ ඉන් කිසිවක හෝ බලතල, කාර්ය සහ කර්තව්‍ය උන්වහන්සේ විසින් ක්‍රියාත්මක කරනු හා ඉටු කරනු ලැබිය හැකි ය ; සහ

(iii) උන්වහන්සේ කලින් තම ධුරයෙන් ඉවත් වුවහොත් මිස, උන්වහන්සේ පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් මේ වගන්තියේ (3) වන උපවගන්තියේ සහ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එම ධුරය දැරිය යුතු ය. තවද (2) වන උප වගන්තියේ (iv) වන අනුජේදයේ කුමක් සඳහන්ව ඇතද ඒ නොතකා මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තවදුරටත් අවුරුදු තුනක කාලයකට නැවත පත් කරනු ලැබීමට උන්වහන්සේ සුදුස්සෙක් වන්නේ ය.

(ආ) විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ උපසම්පදාව ලැබීමෙන් පසු අවුරුදු විස්සක් සම්පූර්ණ කළ විනයධර භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය. තවද උන්වහන්සේ පිළිගත් විශ්වවිද්‍යාලයක බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා සිටිය යුතු අතර ප්‍රාචීන භාෂා පිළිබඳ හසල දැනුමක් ලබා සිටින තැනැත්තෙක් විය යුතු ය.

(2) (i) තදනන්තර මහෝපාධ්‍යාය ධුරය සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ පළවන පුවත්පතක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පළ කරනු ලැබිය යුතු ය.

(ii) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති භික්ෂු අයදුම්කරුවන් අතරින් නම් තුනක් පාලක සභාව විසින් තෝරාගෙන ඒ නම් තුන මේ පනතේ 12 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලැබූ උත්තරීතර සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(iii) මේ පනතේ 12 වන වගන්තිය යටතේ සංස්ථාපිත උත්තරීතර සභාව විසින් ඒ අයදුම්කාර භික්ෂුන් වහන්සේලාගේ අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසු එකී නම් ඉදිරිපත් කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත දී ඔවුනතුරෙන් එක් අයදුම්කාර භික්ෂුන් වහන්සේ නමකගේ නම තෝරා ගෙන එය අමාත්‍යවරයා වෙත නිර්දේශ කළ යුතු ය.

(iv) උත්තරීතර සභාව විසින් නිර්දේශ කරනු ලැබූ භික්ෂුන් වහන්සේ විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් අවුරුදු තුනක කාලයකට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. අනුයාත ධුර කාල පරිච්ඡේද දෙකකට වැඩි කාලයකට කිසිදු භික්ෂුන් වහන්සේ නමක් විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ ලෙස පත් නොකරනු ලැබිය යුතු ය.

(v) තම ධුර කාලය අවසන්වීම හෝ ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුකොටගෙන යම් මහෝපාධ්‍යායයන් වහන්සේ නමක් විසින් තම ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක දී උන්වහන්සේ විශ්‍රාම ගතයුතු වයස සම්පූර්ණ කර නැත්නම්, උන්වහන්සේ මහෝපාධ්‍යායයන් වහන්සේ ලෙස පත් කරනු ලැබීමට පෙර විශ්වවිද්‍යාලයේ දරමින් සිටි තනතුරට ආපසු පත් කරනු ලැබිය යුතු ය.

(3) මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ යහපතට හානිකර ආකාරයකින් ක්‍රියාකර ඇති බව ඔප්පු කිරීමට සැහෙන කරුණු ඇතැයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ නියමයක් මගින් මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(4) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීමේ කාර්යය සඳහා කැඳවනු ලබන උත්තරීතර සභාවේ විශේෂ රැස්වීමක දී උත්තරීතර සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන්

තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත, අමාත්‍යවරයා විසින් මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු වන අතර, එහි ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද වන්නේ ය. උන්වහන්සේ නිල බලයෙන් උත්තරීතර සභාවේ සාමාජිකයකු වන අතර නිල බලයෙන් පාලක සභාව හා සනාතන සභාව යන දෙකෙහිම සාමාජිකයෙක් හා සභාපතිවරයාද වන්නේය. මහා මහෝපාධ්‍යායයන් වහන්සේ පැමිණ නොමැති විට මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් උත්තරීතර සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. විශ්වවිද්‍යාලයේ වෙනත් යම් බල මණ්ඩලයක නැතහොත් වෙනත් යම් මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට එහි පැමිණ සිටීමට හා එහිදී කථා කිරීමට උන්වහන්සේට හිමිකම ඇති නමුත් උන්වහන්සේ ඒ වෙනත් යම් බල මණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට උන්වහන්සේට හිමිකම නොමැත්තේ ය.

(5) මේ පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලා ගැනීම මහෝපාධ්‍යායයන් වහන්සේගේ කාර්යය වන්නේ ය. තවද ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි උන්වහන්සේ විසින් සලකනු ලබන සියලු බලතල උන්වහන්සේට ඇති අතර, උන්වහන්සේ විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ හා සනාතන සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම, මහෝපාධ්‍යායයන් වහන්සේගේ කාර්යය වන්නේ ය.

(7) විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වා ගැනීම ගැන මහෝපාධ්‍යායයන් වහන්සේ වග කිව යුතු ය.

(8) මහෝපාධ්‍යායයන් වහන්සේ කලින් ධුරය අත්හැර ගියහොත් හෝ මේ වගන්තියේ (3) වන උපවගන්තිය සහ (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, වර්ෂ තුනක කාලසීමාව හෝ හැටපස්වන විය හෝ සම්පූර්ණ කිරීම යන දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දැරිය යුතු ය.

(9) නිවාඩු පිට සිටීම, රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටීම හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා තම ධුරයේ කටයුතු කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී ඒ ධුරයේ කටයුතු කිරීම සඳහා සුදුසු යයි පාලක සභාව විසින් සලකනු ලබන වැඩ පිළිවෙලක් ඒ අශක්නුතාව ඇති වූ දින සිට දින හතක් තුළ දී පාලක සභාව විසින් යෙදිය යුතු ය. එවැනි වැඩ පිළිවෙලක් යොදනු ලබන තෙක් ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ සාමාන්‍ය ස්වභාවයේ එදිනෙදා කටයුතු කර ගෙන යා යුතු ය.

(10) මහෝපාධ්‍යායය ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ ධුරයේ කටයුතු ඉටු කිරීමට මේ වගන්තියේ මීට පූර්වයෙන් වූ විධිවිධාන යටතේ ස්ථිර පත්වීමක් කරන තෙක් සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන වැඩ පිළිවෙලක් ඒ පුරප්පාඩුව ඇතිවී දින හතක් ඇතුළත අමාත්‍යවරයා විසින් යෙදිය යුතු ය. තවද එවැනි වැඩ පිළිවෙලක් අමාත්‍යවරයා විසින් යොදන තෙක්, ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ සාමාන්‍ය ස්වභාවයේ එදිනෙදා කටයුතු කරගෙන යා යුතු ය.

ලේඛකාධිකාරී-වරයා.

8. (1) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රථම ලේඛකාධිකාරිවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. තදනන්තර සෑම ලේඛකාධිකාරිවරයකුම නැවත අලුත් කළ හැකි වන පරිදි අවුරුදු තුනක කාල සීමාවක් සඳහා පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ සහ අදාළ නිලධරයාගේ එකඟත්වය ඇතිව මිස රජයේ සේවයේ නිලධරයකු විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා ලෙස පත් නොකළ යුතු ය.

(2) ලේඛකාධිකාරිවරයා ගිහි බෞද්ධයකු විය යුතු අතර ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයෙක් වන්නේ ය. මේ පනතින් ඔහු වෙත පවරා ඇති හෝ නියම කොට ඇති බලතල, කාර්යය සහ කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතු ද, ඉටුකළ යුතු ද වන්නේ ය. තවද, ඔහු, නිල බලයෙන්, විශ්වවිද්‍යාලයේ උත්තරීතර සභාවේත් පාලක සභාවේත් සනාතන සභාවේත් ලේකම්වරයා වන්නේ ය.

(3) ලේඛකාධිකාරිවරයා විශ්වවිද්‍යාලයේ ගණන්දීමේ නිලධරයා වන අතර, විශ්වවිද්‍යාලයේ මුදල් සහ දේපළ යථා පරිදි පරිපාලනය කිරීම පිළිබඳව ඔහු වගකිව යුතු ය. ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී විශ්වවිද්‍යාලයේ මුදල් සහ දේපළ පරිපාලනය කිරීම පිළිබඳව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කරනු ලබන යම්

තීරණයකට හෝ නියමයකට හෝ විධානයකට අනුකූලව ඔහු ක්‍රියාකළ යුතු වන්නේ ය. තව ද, මේ පනතින් හෝ නියමාවලි මගින් හෝ රීති මගින් හෝ ඔහු වෙත පවරා දෙනු ලබන හෝ නියම කරනු ලබන සියලු බලතල , කාර්ය සහ කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතු ද ඉටු කළ යුතු ද වන්නේ ය.

(4) ඉල්ලා සිටි විට මහෝපාධ්‍යායයන් වහන්සේට ලේඛකාධිකාරිවරයා සහාය විය යුත්තේ ය.

(5) මහෝපාධ්‍යායයන් වහන්සේගේ විධානයට සහ පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් ලේඛාකාධිකාරිවරයා වගකිව යුත්තේ ය.

9. (1) විශ්වවිද්‍යාලයේ ප්‍රථම මූල්‍යාධිකාරිවරයා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. තදනන්තර සෑම මූල්‍යාධිකාරිවරයකුම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු ගිහි බෞද්ධයකු විය යුතු අතර විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයෙක් වන්නේ ය. මේ පනතින් ඔහු වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ සහ භාර කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය. මූල්‍යාධිකාරිවරයා.

(2) මහෝපාධ්‍යායයන් වහන්සේගේ විධානයට හා පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ මුදල් පරිපාලනය සම්බන්ධයෙන් මූල්‍යාධිකාරිවරයා වගකිව යුතු අතර නීතියෙන් නියම කරනු ලැබ ඇති ආකාරයට හා එසේ නියම කොට ඇති ආකෘතියට අනුව ඔහු විසින් විශ්වවිද්‍යාලයේ ගිණුම් පවත්වාගෙන යා යුතු ය. විශ්වවිද්‍යාලයේ අරමුදල් ඔහු භාරයේ තිබිය යුතු ය.

10. (1) විශ්වවිද්‍යාලයේ ප්‍රථම පුස්තකාලයාධිකාරිවරයා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. තදනන්තර සෑම පුස්තකාලයාධිකාරිවරයකුම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු ගිහි බෞද්ධයකු විය යුතු අතර විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයෙක් වන්නේ ය. මේ පනතින් ඔහු වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය. පුස්තකාලයාධි-කාරි වරයා.

(2) මහෝපාධ්‍යායයන් වහන්සේගේ විධානයට හා පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ හෝ පුස්තකාලවල පරිපාලනය සම්බන්ධයෙන් පුස්තකාලයාධිකාරිවරයා වගකිව යුතු ය.

## III වන කොටස

### විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල

විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල.

**11.** විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල පහත දැක්වෙන පරිදි විය යුත්තේ ය :—

(i) උත්තරීතර සභාව;
(ii) පාලක සභාව ;
(iii) සනාතන සභාව .

විශ්වවිද්‍යාලයේ උත්තරීතර සභාව.

**12.** (1) මෙහි මින් මතු "උත්තරීතර සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන විශ්වවිද්‍යාලයේ උත්තරීතර සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(i) ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක්;

(ii) ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක් ;

(iii) ශ්‍රී ලංකා අමරපුර නිකායේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ ඒ නිකායේ උත්තරීතර මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක් ;

(iv) ශ්‍රී ලංකා රාමාඤ්ඤ නිකායේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක් ;

(v) අනුරාධපුර අටමස්ථානයේ නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක් ;

(vi) මහෝපාධ්‍යායයන් වහන්සේ ; සහ

(vii) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන උගත් සම්භාවනීය භික්ෂූන් වහන්සේලා පස් නමකට නොවැඩි වූ ස්වාමින් වහන්සේලා සංඛ්‍යාවක් සහ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට සම්බන්ධ ගිහියන් දෙදෙනෙක්.

(2) මහා මහෝපාධ්‍යායයන් වහන්සේ උත්තරීතර සභාවේ සභාපතිවරයා විය යුතු අතර, උත්තරීතර සභාවේ සෑම රැස්වීමකම මුලසුන උන්වහන්සේ විසින් දැරිය යුතු ය.

(3) උත්තරීතර සභාවට නම් කරනු ලැබූ සාමාජිකයෙක්, ඔහු කලින් ධුරය අත්හැරියහොත් මිස, ඔහු නම්කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් මිස, නැවත නම් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුවද යම් නම් කරනු ලැබූ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත් වීමට පෙර තම ධුරය අත්හැරියහොත් ඔහුගේ අනුගාමියා විසින්, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් උත්තරීතර සභාවේ නම් කරනු ලැබූ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(5) උත්තරීතර සභාවෙන් අවසර ලබා නොගෙන උත්තරීතර සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන උත්තරීතර සභාවේ නම්කළ සාමාජිකයකු, උත්තරීතර සභාවේ සාමාජිකයකු වශයෙන් දැරූ තම ධුරය අත්හැර ගිය ලෙස සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීමට අමාත්‍යවරයා විසින් සුදුසු තැනැත්තකු නම් කළ යුතු ය.

(6) උත්තරීතර සභාවේ සාමාජිකයකුට කිසිදු පාරිශ්‍රමිකයකට හිමිකම් නොමැති නමුත්, (1) වන උපවගන්තියේ (vii) වන ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයකුට මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

(7) උත්තරීතර සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය ඒ සභාවේ මුළු සාමාජික සංඛාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නියම කරනු ලබන දිනයක දී උත්තරීතර සභාවේ වාර්ෂික රැස්වීම පවත්වනු ලැබිය යුතු ය.

(9) අවශ්‍ය යයි මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් සලකනු ලබන කවර වුවද අවස්ථාවක දී හෝ උත්තරීතර සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමක් මහා මහෝපාධ්‍යායයන්

වහන්සේ ට ලැබී සති දෙකක් තුළ දී හෝ උන්වහන්සේ විසින් උත්තරීතර සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

උත්තරීතර සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**13.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, උත්තරීතර සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(අ) මහෝපාධ්‍යායයන් වහන්සේ පත් කිරීම හා මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරයෙන් පහ කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම ;

(ආ) නියමාවලි සෑදීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගණන් සලකා බැලීම ;

(ඈ) මේ පනතින් බලය පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ වෙනත් යම් කාර්යයක් ඉටු කිරීම.

විශ්වවිද්‍යාලයේ පාලක සභාව.

**14.** මෙහි මින් මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන විශ්වවිද්‍යාලයේ පාලක සභාව, විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය ද පාලක බල මණ්ඩලය ද වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(i) මහෝපාධ්‍යායයන් වහන්සේ ;

(ii) බුද්ධශාසන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තෙක් ;

(iii) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තෙක් ;

(iv) විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා ;

(v) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, බුද්ධ ශාසනයට විශිෂ්ට සේවයක් ඉටුකර ඇති උගත් භික්ෂූන් වහන්සේලා පස් නමකට සහ ගිහි බෞද්ධයන් තිදෙනකුට නොවැඩි සංඛ්‍යාවක්.

(2) මහෝපාධ්‍යායයන් වහන්සේ පාලක සභාවේ සභාපතිවරයා වන අතර පාලක සභාවේ සියලුම රැස්වීම්වල මුලසුන උන්වහන්සේ විසින් දැරිය යුතු ය. යම් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වුවහොත් ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමට පැමිණ සිටින යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීමට තෝරා ගත යුතු ය.

(3) (4) වන සහ (5) වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ යම් පත් කරනු ලැබූ සාමාජිකයෙක්, ඔහු කලින් ධුරය අත්හැරියහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතු වන අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය :

එසේ වුවද යම් නම් කරනු ලැබූ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත් වීමට පෙර තම ධුරය අත්හැරියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, තමාද කලින් ධුරය අත්හැරියහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ පමණක් ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් පාලක සභාවේ පත් කරනු ලැබූ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) කවර වුවද හේතුවක් නිසා පාලක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන පාලක සභාවේ පත්කරනු ලැබූ සාමාජිකයකු පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් දැරූ තම ධුරය අත්හැර ගිය ලෙස සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීමට අමාත්‍යවරයා විසින් සුදුසු තැනැත්තකු පත් කළ යුතු ය.

(6) පාලක සභාවේ සාමාජිකයකුට යම් පාරිශ්‍රමිකයකට හිමිකම් නොමැති නමුත් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනා ඔහුට ගෙවනු ලැබිය හැකි ය.

(7) පාලක සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් සංයුක්ත වන්නේ ය.

(8) අවශ්‍ය කවර අවස්ථාවක වුවද, පාලක සභාව රැස්විය යුතු ය. කෙසේ වුවද එක් වර්ෂයක දී දහවතාවකට නොඅඩු වාර ගණනක් පාලක සභාව රැස්විය යුතු ය.

(9) අවශ්‍ය යයි තමා සලකන කවර හෝ අවස්ථාවක නැතහොත් පාලක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් තමාට ලැබී සතියක් ඇතුළත, පාලක සභාවේ සභාපතිවරයා විසින් පාලක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

පාලක සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

15. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලය වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ භාර කොට ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) (i) වන උපවගන්තියෙන් පාලක සභාව වෙත පවරනු ලැබූ බලතලවල සාකල්‍යතාවට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) විශ්වවිද්‍යාලයේ දේපළ සහ අරමුදල් දැරීම, ඒවා පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ii) විශ්වවිද්‍යාලය සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ විශ්වවිද්‍යාලයේ පොදු මුද්‍රාවෙහි ආකෘතිය නිශ්චය කිරීම, එහි භාරය සඳහා විධිවිධාන සැලැස්වීම සහ එහි භාවිතය මෙහෙයවීම ;

(iii) විශ්වවිද්‍යාලයට සම්බන්ධ සියලු කාරණා, මේ පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව, විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(iv) නිශ්චිත කාර්ය සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රයෝජනය පිණිස සපයා ඇති අරමුදල් කිසිවක් පාලනය කිරීම ;

(v) අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හා ප්‍රදාන මගින් විශ්වවිද්‍යාලයට පවරනු ලබන දේපළ, භාර ගැනීම හා පිළිගැනීම ;

(vi) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් සලකා බැලීම හා ඒ වාර්තා සහ ගණන් උත්තරීතර සභාව වෙත සහ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(vii) විශ්වවිද්‍යාලයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම ;

(viii) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(ix) විශ්වවිද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහභාණ්ඩ, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(x) විශ්වවිද්‍යාලයෙහි සේවය සඳහා තැනැත්තන් පත්කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහකිරීම හෝ වෙනත් ආකාරයකින් ඔවුන් විෂයෙහි විනය පාලනය ගෙනයාම :

එසේ වුවද නිලධරයන් හා ආචාර්යවරයන් සම්බන්ධයෙන් හැර, මේ බලතල මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත පවරනු ලැබිය හැකි ය.

(xi) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙන් හෝ ඉන් බැහැරින් හෝ මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් පත්කිරීම සහ ඔවුන්ට ගෙවිය යුතු වැටුප් සහ ගාස්තු නිශ්චය කිරීම ;

(xii) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සාමාන්‍ය සුභසිද්ධිය දියුණු කිරීම සඳහා ශිෂ්‍ය භික්ෂු නියෝජිතයන්ද ඇතුළත් විය යුතු සුභසාධක මණ්ඩලයක් පත් කිරීම ඒ මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍ය නියමාවලි මගින් කරනු ලැබිය යුතු ය ;

(xiii) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත්වීම හා විශ්වවිද්‍යාලයට අයත් මුදල් කිසිවක්, භාර ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාර අරමුදල් නීත්‍යනුකූලව ආයෝජනය කළ හැකි සුරැකුම්පත් කිසිවක ආයෝජනය කිරීම හෝ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකාව තුළ පිහිටි නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජන කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ එවැනි මුදල්වලින් වහාම කළයුතු වියදම් සඳහා අවශ්‍ය නොවන යම් කොටසක් යම් බැංකුවක ස්ථිර තැන්පතුවක් වශයෙන් තැන්පත් කිරීම ;

(xiv) සනාතන සභාව විමසීමෙන් පසු, විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ, නිලධරයන්ගේ, උපාධිධාරීන්ගේ සහ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ශාස්ත්‍රීය ලාංඡන නිශ්චය කිරීම ;

(xv) විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන විභාග සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීම පිණිස අවශ්‍ය වන අවශ්‍යතා කවරේදැයි නිශ්චය කිරීම ; සහ

(xvi) ක්‍රියාත්මක කිරීම සඳහා මේ පනතින් වෙනත් විධිවිධාන සලස්වා නොමැති විශ්වවිද්‍යාලයේ අනෙක් සියලු බලතල ක්‍රියාත්මක කිරීම :

එසේ වුවද, පළමුකොට තම මතය වාර්තාගත කොට ඒ මතය පාලක සභාව වෙත ඉදිරිපත් කිරීමට සනාතන සභාවට අවස්ථාවක් දී ඇත්නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් පාලක සභාව විසින් සම්මත කර ගනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ "අධ්‍යයන කාරණය" යන්නෙන්, සනාතන සභාවේ පාලනයට සහ සාමාන්‍ය විධානයට යටත් කවර වුවද කාරණයක් අදහස් වේ.

සනාතන සභාව.

16. (1) (මේ පනතේ මින් මතු "සනාතන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බලමණ්ඩලය වන්නේ ය.

(2) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(i) මහෝපාධ්‍යායයන් වහන්සේ ;

(ii) විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානියා ;

(iii) බුද්ධාගම, අධ්‍යාපනය හෝ ඊට සම්බන්ධ කිසියම් විෂයයක් ඉගැන්වීමේ කාර්යයෙහි යෙදී සිටින වෙනත් යම් විශ්වවිද්‍යාලයක ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් මේ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන නියෝජිතයන් තිදෙනෙක් ;

(iv) ඉහත (iii) වන ඡේදයෙහි සඳහන් තැනැත්තන් නොවන, විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම කාර්යයෙහි යෙදී සිටින ස්ථිර ආචාර්ය මණ්ඩලය විසින් ඔවුන් අතුරින් පත්කර ගනු ලබන ආචාර්යවරු දෙදෙනෙක් ;

(v) කිසිදු විශ්වවිද්‍යාලයක ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන ගිහි හෝ පැවිදි පක්ෂයේ උගත් සම්භාවනීය තැනැත්තන් අතුරින් විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

(3) සනාතන සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(4) විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය සනාතන සභාව සතු වන්නේ ය.

සනාතන සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

17. (1) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව, සනාතන සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) අදාළ අධ්‍යයන අංශවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම සහ අනුමතය සඳහා ඒ කෙටුම්පත් පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ii) අදාළ අධ්‍යයන අංශවල වාර්තා සලකා බැලීමෙන් පසු විභාග පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන්ගේ නම් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(iii) විශ්වවිද්‍යාලයේ මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, විභාග පරීක්ෂක සහ වෙනත් අධ්‍යයන තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(iv) අදාළ අධ්‍යයන අංශවල වාර්තා සලකා බැලීමෙන් පසු-

(අ) පවත්නා අධ්‍යයන අංශ ප්‍රතිසංවිධානය කිරීම සහ අලුත් අධ්‍යයන අංශ සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ආ) අදාළ අංශවලට අධ්‍යයන විෂයන් පැවරීම, පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ආධාර ශිෂ්‍යත්ව හා වෙනත් ත්‍යාග සඳහා තරග කිරීමේ ක්‍රමය හා කොන්දේසි, පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(vi) පාලක සභාව විසින් අනුමත කරනු ලබන කොන්දේසි මත, අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ආධාර ශිෂ්‍යත්ව හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(vii) සුදුසු යයි සනාතන සභාවට පෙනී යන පරිදි සනාතන සභාවේ ස්ථාවර කමිටු, තත්කාර්ය කමිටු හෝ මණ්ඩල සංඛ්‍යාවක් සහ විශේෂයෙන්, එහෙත්, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සාකල්‍යභාවයට හානියක් නොමැතිව -

(අ) පුස්තකාල කමිටුවක් ;

(ආ) විෂයමාලා හා අගැයීමේ කමිටුක් ; සහ

(ඇ) ආධුනික අධ්‍යයන නිවාඩු කමිටුවක්, පත්කිරීම සහ ඒවාට භාර කරනු ලැබිය යුතු විෂය කරුණු නිශ්චය කිරීම, ඒවායේ වාර්තා සලකා බැලීම සහ මඳ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ; සහ

(viii) අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළුකර ගැනීම සඳහා නියමිත අවශ්‍යතා, පාලක සභාවට නිර්දේශ කිරීම.

බල මණ්ඩලයක යම් පුරප්පාඩුවක් තිබීම හෝ බල මණ්ඩලයක සාමාජිකයකු පත් කිරීමේ හෝ නම් කිරීමේ යම් දෝෂයක් තිබීම හෝ හේතුකොට ගෙන ඒ බලමණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් බල රහිත නොවන බව.

18. යම් බලමණ්ඩලයක සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ යම් බලමණ්ඩලයකට සාමාජිකයකු පත් කිරීමේ හෝ නම් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුකොට ගෙනම පමණක් ඒ බලමණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් බලරහිත නොවන්නේ ය.

## IV වන කොටස

### අමාත්‍යවරයාගේ බලතල

අමාත්‍යවරයාගේ වගකීම.

**19.** විශ්වවිද්‍යාල අධ්‍යාපනය පොදුවේ මෙහෙයවීම සහ මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා වග කිව යුතු ය.

විශ්වවිද්‍යාලය වෙත විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**20.** (1) (අ) මුදල්, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සඳහා විශ්වවිද්‍යාලයේ තැන් ලබා දීම සහ ඉගැන්වීම් මාධ්‍යය යනාදී කාරණා සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සාමාන්‍ය ලිඛිත විධාන අමාත්‍යවරයා විසින් කලින් කල විශ්වවිද්‍යාලය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම විධානයක්ම හැකි තාක් ඉක්මණින් පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු ය.

(ආ) විශ්වවිද්‍යාලය ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීමට විශ්වවිද්‍යාලයට හැකිවන පරිදි අවශ්‍ය පහසුකම් හා තොරතුරු විශ්වවිද්‍යාලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ ලබා දීම හා සැපයීම විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කළ යුතු ය.

(ඇ) මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු වගකීම සඵලාකාරයෙන් ඉටු කිරීමට අමාත්‍යවරයාට හැකිවන පරිදි විශ්වවිද්‍යාලයේ කටයුතු සියල්ලම හෝ ඉන් යම් කටයුත්තක් හෝ එහි පරිපාලනය හෝ විමර්ශනය කොට වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට කලින් කල, නියම කළ හැකි ය.

(ඈ) අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ නියමය අනුව ක්‍රියා කළ යුතු අතර, ඒ නියමය අනුව ක්‍රියා කිරීමට ඒ ලේකම්වරයාට හැකිවන පරිදි අවශ්‍ය පහසුකම් හා තොරතුරු විශ්වවිද්‍යාලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට ලබාදීම හා සැපයීම විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කළ යුතු ය.

(2) විශ්වවිද්‍යාලයේ පවත්නා තත්වය රාජ්‍ය ආරක්ෂාවට අනතුරුදායක හෝ ජාතික ප්‍රතිපත්තියට පටහැනි හෝ හානිකර හෝ විය හැකි බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒ තත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන සියලු පියවර ගැනීමට, අමාත්‍යවරයා විසින්, පාලක සභාවට විධාන කළ හැකි ය.

(3) යම් වර්ජනයක් හෝ පිටමං කිරීමක් හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා විශ්වවිද්‍යාලයේ වැඩකටයුතුවල පරිපාලනය බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එහි කටයුතු හා පරිපාලනය යථා තත්වයට පත් කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ කටයුතු යථා තත්වයට පත් කිරීම සඳහා අවශ්‍යවන සියලු ක්‍රියා මාර්ග අමාත්‍යවරයා විසින් ගත හැකි ය. ඒ කටයුතු යථා තත්වයට පත් කරන තුරු අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, විශ්ව විද්‍යාලයට අදාළව පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් පිළිබඳව අවශ්‍ය යයි ඔහු සලකන සියලු විධිවිධාන සැලැස්විය හැකි යः-

(අ) විශ්වවිද්‍යාලය තාවකාලිකව වසා දැමීම ;

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, බල මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් වෙත පවරා ඇති, පනවා ඇති හෝ භාර කොට ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, ඒ නිලධරයා, බල මණ්ඩලය හෝ වෙනත් පුද්ගල මණ්ඩලය වෙනුවට ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා නිසි බලධරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් හෝ පත් කිරීම ;

(ඇ) ඉහත කී කාරණාවලට සම්බන්ධ වූ හෝ අදාළ වූ වෙනත් යම් කරුණක්.

(4) අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් එහි සඳහන් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. ඉන්පසු හැකිතාක් ඉක්මණින් එකී නියමය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු අතර, කලින් පරිච්ඡින්න කරනු ලැබුවහොත් මිස, ඒ නියමය ඉන්පසු මාස තුනක් නොඉක්මවන කාලයක් වලංගුව පවත්නේ ය.

## V වන කොටස

### විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය

විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.

**21.** (1) විශ්වවිද්‍යාලය විසින්, උපාධි පිරිනැමීමේ කාර්ය සඳහා, සෑම වර්ෂයකටම වරක්, මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අනුමත කරනු ලබන දිනයක දී හෝ දිනවල දී උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්විය යුතු ය :

එසේ වුවද, උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා ප්‍රථම උපාධි පිරිනැමීම කළ හැකි ය.

(2) උපාධි ප්‍රදානෝත්සවයක කාර්ය පටිපාටිය අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ යුතු ය.

(3) මහා මහෝපාධ්‍යායයන් වහන්සේ පැමිණ සිටින විට උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන උන්වහන්සේ විසින් දැරිය යුතු ය. උන්වහන්සේ පැමිණ නොසිටි අවස්ථාවක දී මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඒ උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය.

## VI වන කොටස

### කාර්ය මණ්ඩලයට කරනු ලබන පත්කිරීම්

කාර්ය මණ්ඩලයට කරනු ලබන පත්කිරීම් පාලක සභාව විසින් කළ යුතු බව.

**22.** විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත්කිරීමක්ම, බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සහ මේ පනතේ විධිවිධාන පරිදි පත්කිරීමේ කාර්ය පටිපාටියට අනුකූලව පාලක සභාව විසින් කරනු ලැබිය යුතු ය.

ආචාර්යවරයන් පත් කිරීම.

**23.** (1) භික්ෂූන් වහන්සේ නමක් නොවන කිසිදු තැනැත්තකු ආචාර්යවරයකු වශයෙන් විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයට පත් නොකළ යුතු ය.

(2) භික්ෂූන් වහන්සේ නමක් නොවන, එහෙත් බුද්ධාගම අදහන සහ නියෝග මගින් නියම කොට ඇති අධ්‍යාපන සුදුසුකම් දරන පුරුෂයකු බාහිර ආචාර්යවරයකු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියකින් තොරව, ආචාර්ය තනතුරකට කරනු ලබන සෑම පත්කිරීමක්ම, පළමුකොට වර්ෂ තුනක පරිවාස කාල පරිච්ඡේදයකට යටත්ව විය යුතු අතර, එක් වරකට එක් වර්ෂය බැගින් වර්ෂ පහක් නො ඉක්මවන වැඩිදුර කාලයකට ඒ පරිවාස කාලය පාලක සභාව විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය. එවැනි පත්කිරීමක්, රීතිවලින් නියම කොට ඇති අදාළ බඳවාගැනීමේ පටිපාටියෙන් විධිවිධාන සලස්වා ඇති සුදුසුකම්වලට හෝ කොන්දේසිවලට යටත් විය යුතු ය.

ආචාර්ය වරයන් විශ්‍රාම ගැනීම.

**24.** තම තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින ආචාර්ය තනතුරක් දරන්නකු වයස අවුරුදු හැටපහ සම්පූර්ණ වනතුරු හෝ, යම් අධ්‍යයන වර්ෂයක් අතරතුරේ දී ඔහු වයස අවුරුදු හැටපහ සම්පූර්ණ කරන අවස්ථාවක දී ඒ අධ්‍යයන වර්ෂයේ අවසාන දිනය වන තුරු තම තනතුරු දැරිය යුතු අතර, ඉන්පසු ඔහු සේවයෙන් විශ්‍රාම ගත් ලෙස සැලකිය යුතු ය:

එසේ වුවද, එවැනි ආචාර්ය තනතුරක් දරන භික්ෂූන් වහන්සේ නමකගේ සේවය, විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම බලාපොරොත්තුවෙන්, කවර වේලාවක වුවද අත්හිටුවීම හෝ එවැනි පරීක්ෂණයකින් පසු වරදකරු වුවහොත් පාලක සභාව විසින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මුතියක් මත උන්වහන්සේ සේවයෙන් පහකිරීම හෝ විශ්‍රාම ගැන්වීම හෝ කරනු ලැබිය හැකි ය.

ආචාර්ය තනතුරක් නොවන තනතුරකට කරනු ලබන පත්කිරීම්.

**25.** ආචාර්ය තනතුරක් නොවන තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක්ම පළමු කොට වර්ෂ තුනක පරිවාස කාලයක් සඳහා විය යුතු අතර, ඉන්පසු ඒ පත්කිරීම පාලක සභාව විසින් ස්ථිර කරනු ලැබීමට යටත් වේ:

එසේ වුවද, විශ්වවිද්‍යාලයේ තම සේවයේ ස්ථිර කරනු ලැබ සිටින තැනැත්තකු, විශ්වවිද්‍යාලයේ ආචාර්ය තනතුරක් නොවන වෙනත් තනතුරකට උසස් වීමක් දීමක් වශයෙන් නොව, විශ්වවිද්‍යාලයේ වෙනත් තනතුරකට තදනන්තරව පත් කරනු ලබන අවස්ථාවක දී ඔහුගේ පරිවාස කාලය එක් වර්ෂයක් පමණක් එවිය යුතු ය.

ආචාර්යවරයන් නොවන තැනැත්තන් විශ්‍රාම ගැනීම.

**26.** ආචාර්ය තනතුරක් නොවන තනතුරක් දරන්නකු වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ කරන තුරු තම ධුරය දැරිය යුතු අතර, ඉන්පසු ඔහු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද, එවැනි යම් තනතුරක් දරන්නකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත, පාලක සභාව විසින්, ඔහු වයස අවුරුදු හැට සම්පූර්ණ කරන තුරු, එක් වරකට එක් වර්ෂයක් බැගින් ඔහුගේ සේවය දීර්ඝ කළ හැකි අතර ඉන් පසු ඔහු විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වන බලාපොරොත්තුවෙන් එකී යම් තනතුරක් දරන්නකුගේ සේවය කවර වුවද වේලාවක අත්හිටුවිය හැකි ය: නැතහොත් ඒ පරීක්ෂණයෙන් පසුව ඔහු වරදකරු කරනු ලැබුවහොත් පාලක සභාව විසින් සම්මත කරගනු ලබන යෝජනාවක් මගින් ඔහු සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම හෝ කළ හැකි ය.

**27.** (1) පාලක සභාවේ ඉල්ලීම පිට සහ මේ පනතේ 23 වන වගන්තියට යටත්ව, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ ඒ නිලධරයා සේවයෙහි යොදවනු ලැබ සිටින්නේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, පාලක සභාව විසින්, එවැනි ම කැමැත්ත යටතේ නිශ්චය කරනු ලබන කාලයකට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය : නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඔහු ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14(2) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන අතර, එම කාර්ය මණ්ඩලයට රජයේ සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ විට, එකී පනතේ 14 (3) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු විශ්වවිද්‍යාලය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් විශ්වවිද්‍යාලයේ සේවය කළ යම් කාල පරිච්ඡේදයක්, එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, ඔහු විසින් ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**28.** (1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු යම් නිලධරයකු, කථිකාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ සේවකයකු, පාලක සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ, කථිකාචාර්යවරයාගේ, මහාචාර්යවරයාගේ, සහාය මහාචාර්යවරයාගේ හෝ සේවකයාගේ ද එකී පනත යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ එකී උසස් අධ්‍යාපන
35 ආයතනයේ පාලක බල මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත යටතේ, පාලක සභාව විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

උසස් අධ්‍යාපන ආයතනවල නිලධරයන් සහ සේවකයන් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

(2) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු යම් නිලධරයකු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරන ලද අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුවද සාමාජිකයකු යටත් වන විනය පාලනයටම එකී නිලධරයා ද යටත් වන්නේ ය.

## VII වන කොටස

### බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල

මේ පනතේ මේ කොටසෙහි අර්ථ නිරූපණය.

**29.** මේ පනතේ මේ කොටසෙහි-

"විශ්‍රාම ගැනීමේ වයස" යන්න-

(අ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය තනතුරක් දරන දායකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, වයස අවුරුදු හැටපහ ඉන් අදහස් වේ ;

(ආ) විශ්වවිද්‍යාලයේ වෙනත් යම් තනතුරක් දරන දායකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඔහු සේවයෙහි යෙදී සිටීම නතර වන වයස ඉන් අදහස් වේ ;

"දායකයා" යන්නෙන් අර්ථසාධක අරමුදලෙහි දායකයකු වන විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙහි යම් සාමාජිකයෙක් අදහස් වේ ;

"ඉපයීම්" යන්නෙන් 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනතෙහි නිර්වචනය කරනු ලැබූ ඉපයීම් අදහස් වේ ;

"අරමුදල" යන්නෙන් මේ පනතේ 39 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල අරමුදල අදහස් වේ ;

"අර්ථසාධක අරමුදල" යන්නෙන් මේ පනතේ මේ කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් පිහිටුවනු ලැබූ අර්ථ සාධක අරමුදල අදහස් වේ ; තවද

"වැටුප" යන්නෙන් යම් දායකයකු දරන ස්ථිර තනතුරෙහි හෝ පත්වීමේ හෝ පඩිනඩි අදහස් වන අතර රීති මගින් ඔහුගේ වැටුපෙහි කොටසක් ලෙස ප්‍රකාශ කරනු ලබන යම් දීමනා ද එයට ඇතුළත් වේ.

**30**. (මෙහි මින් මතු "අර්ථසාධක අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන අර්ථසාධක අරමුදලක් විශ්වවිද්‍යාලය විසින් පිහිටුවිය යුතු ය. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල පිහිටුවීම.

**31**. අර්ථසාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කාරණා සඳහා හෝ අතුරු ව්‍යවස්ථා, පාලක සභාව විසින් සාදනු ලැබිය හැකි ය. අර්ථසාධක අරමුදල විධිමත් කිරීම.

**32**. (1) අතුරු ව්‍යවස්ථා මගින් බැහැර කරනු ලැබූ සාමාජිකයන් හැර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුම විසින් ඒ කාර්ය මණ්ඩලයෙහි තමා සේවයෙහි යොදවනු ලැබූ දිනයෙහි සිට සිය ඉපයීම්වලින් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක් මාස්පතා සිය වැටුපෙන් කරනු ලබන එක සමාන අඩු කිරීම් මගින් අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ය. තවද එයට අතිරේකව, විශ්වවිද්‍යාලය විසින්, ඒ සෑම දායකයකුම වෙනුවෙන්, ඒ දායකයාගේ ඉපයීම්වලින් සියයට පහළොවකට සමාන මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ඒ හා සමගම ගෙවිය යුතු ය. අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම.

(2) අර්ථසාධක අරමුදල සඳහා පොදු ගිණුමක් ද ඒ අර්ථසාධක අරමුදලෙහි එක් එක් දායකයා වෙනුවෙන් වෙනම ගිණුමක් ද ලේඛකාධිකාරිවරයා විසින් ආරම්භ කොට පවත්වාගෙන යා යුතු ය. දායකයකු විසින් අර්ථසාධක අරමුදලට ගෙවනු ලබන සියලු දායක මුදල් සහ දායකයකු වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් අර්ථසාධක අරමුදලට ගෙවනු ලබන සියලු දායක මුදල් එම දායකයා වෙනුවෙන් අර්ථසාධක අරමුදලෙහි පවත්වාගෙන යන ගිණුමට බැර කළ යුතු ය.

(3) තත් කාර්ය සඳහා පාලක සභාව විසින් සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධානවලට යටත්ව, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයකට අනුව වූ වැල් පොළිය, දායකයකු අර්ථසාධක අරමුදලේ දායකයකුව සිටීම පාලක සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව නතරවන දිනය දක්වා වූ කාලයට ගණන් බලා ඒ දායකයාගේ ගිණුමේ බැරට ඇති මුදල් ප්‍රමාණයට එකතු කරනු ලැබිය යුතු ය. තවද එදින දී ඒ දායකයාගේ ගිණුම වසා දැමිය යුතු ය.

දායකයන්ට මුදල් ආපසු ගෙවීම.

**33.** (1) 32 (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි යම් දායකයකුගේ ගිණුම වසා දමනු ලැබූ විට, ලේඛකාධිකාරිවරයා විසින්, 34 වන වගන්තියෙහි විධිවිධානවලට යටත්ව, ආර්ථසාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල ඊට එකතු වී ඇති පොලිය ද සමග ඒ දායකයාට ගෙවිය යුතු ය.

(2) දායකයකුගේ විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීමට පෙර, රෝගාතුර වීම හෝ අශක්නුතාවට පත්වීම හෝ ඔහු නියුක්තව සිටි ධූරය අහෝසි කිරීම හෝ හේතුකොටගෙන, විශ්වවිද්‍යාලය විසින් ඔහු සේවයෙහි යෙදවීම නතර වුවහොත් හෝ ඔහු විශ්ව විද්‍යාල සේවයෙන් ස්වේච්ඡාවෙන් අස්වුවහොත්, අවස්ථාවෝචිත පරිදි, ඔහු එසේ සේවයෙහි නියුක්ත වීම අවසන් වූ දිනයෙහි දී හෝ විශ්වවිද්‍යාල සේවයෙන් ස්වේච්ඡාවෙන් අස් වූ දිනයෙහි දී අර්ථසාධක අරමුදලේ ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග 34 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, විශ්වවිද්‍යාලය විසින් ඒ දායකයාට ගෙවිය යුතු ය.

(3) දායකයකුගේ විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ කිරීමට පෙර විශ්වවිද්‍යාල සේවයෙන් ඔහු පහ කරනු ලැබූ හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ හෝ අවස්ථාවක දී අර්ථසාධක අරමුදලේ ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල, අවස්ථාවෝචිත පරිදි, ඔහු සේවයෙන් පහ කරනු ලැබීමේ හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමේ දිනය දක්වා ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග, 34 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලය විසින් ඒ දායකයාට ගෙවිය යුතු ය.

(4) (අ) අර්ථසාධක අරමුදලෙහි දායකයකු මියයාමෙන් පසු ඒ දායකයාගේ ගිණුමේ බැරට ඇති මුදල් ගෙවනු ලැබිය යුතු (මෙහි මින් මතු මේ වගන්තියේ "නම් කරන ලද තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු දායකයා විසින් නම් කළ යුතු ය.

(ආ) නාම යෝජකගේ අන්තිම කැමති පත්‍රයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, (අ) ඡේදය යටතේ කරන ලද නම් කිරීමක් බලපැවැත්විය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ කරන ලද නම් කිරීමක්, නාම යෝජකගේ ජීවිත කාලය තුළ දී නම් කරන ලද තැනැත්තා මියයාමෙන් හෝ නාම යෝජකයාගේ අත්සන සහතික කරන සාක්ෂිකරුවකු ඉදිරිපිට නාමයෝජක විසින් අත්සන් කරනු ලබන ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ලිඛිත දැන්වීමක් මගින් හෝ නාමයෝජක විසින් තදනන්තරව කරනු ලබන යම නම් කිරීමක් මගින් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස, සලකනු ලැබිය යුතු ය.

(ඈ) නම් කරන ලද තැනැත්තා විසින් තම අනන්‍යතාව සම්බන්ධයෙන් ලේඛකාධිකාරිවරයා සෑහීමට පත් කරනු ලැබේ නම් මිස, අර්ථසාධක අරමුදලේ දායකයකුගේ ගිණුමෙහි ඔහුගේ බැරට ඇති මුදල් ඔහුගේ නම් කරන ලද තැනැත්තාට ගෙවනු නොලැබිය යුතු ය.

(ඉ) දායකයකු මිය යාමෙන් පසු අර්ථසාධක අරමුදලේ ඔහුගේ බැරට ඇති යම් මුදලක් ඒ දායකයාගේ නම කරන ලද තැනැත්තාට ගෙවීම, ඒ මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයේ සියලු බැඳීම් ඉටු කිරීමක් වන්නේ ය.

(5) විශ්වවිද්‍යාලයේ සේවයේ යෙදී සිටිය දී දායකයකු මියගිය අවස්ථාවක දී, අර්ථසාධක අරමුදලේ ඔහුගේ ගිණුමේ බැරට ඇති සම්පූර්ණ මුදල, ඊට උපචිත වී ඇති පොළිය ද සමග, (4) වන උපවගන්තිය යටතේ නම් කර ඇති, නම් කරන ලද තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ, වලංගු නම් කිරීමක් නොමැති නම් ඒ මුදලට නීත්‍යානුකූල හිමිකම ඇති තැනැත්තන්ට, ලේඛකාධිකාරිවරයා විසින් 34 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ගෙවිය යුතු ය.

**34**. මේ කොටසේ ඉහතින් දැක්වුණු විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ නොතකා සහ වෙනත් යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට අගතියකින් තොරව– අර්ථසාධක අරමුදලෙන් ගෙවීම් කිරීමට පෙර ඉන් කරනු ලබන අඩු කිරීම්.

(අ) දායකයා විශ්වවිද්‍යාලයේ සේවයෙහි නියුක්තව සිටි කාල පරිච්ඡේදය තුළ කවර වුව ද අවස්ථාවක දී ඔහුගේ වංකභාවය හෝ නොසැලකිල්ල හේතු කොට ගෙන විශ්වවිද්‍යාලයට සිදු වූ යම් හානියක හෝ අලාභයක ප්‍රමාණය ; හෝ

(ආ) දායකයා විසින් විශ්වවිද්‍යාලයෙන් ලබාගෙන ඇති යම් ණය මුදලකින් අය විය යුතුව ඇති මුදල් ප්‍රමාණය ; හෝ

(ඇ) අර්ථසාධක අරමුදලේ තමාගේ බැරට ඇති මුදල් ප්‍රමාණයෙන් අය කර ගනු ලැබීමට දායකයකු එකඟවෙමින් ඔහු විසින් අත්සන් කරන ලද බැඳුම්කරයක්, ගිවිසුමක් හෝ වෙනත් යම් සාධන පත්‍රයක් යටතේ අය විය යුතු මුදල් ප්‍රමාණ,

අර්ථසාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමේ බැරට ඇති මුදල් ප්‍රමාණය විෂයෙහි ප්‍රථම අයභාරය විය යුතු අතර, 33 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් මුදලක් ගෙවනු ලබන අවස්ථාවක දී ඒ මුදල් ප්‍රමාණය අඩු කර ගනු ලැබිය හැකි ය.

නොගෙවා ඇති අර්ථසාධක අරමුදල්වලට ඇතැම් අවස්ථාවල දී වැල් පොළිය උපචිත විය යුතු බව.

**35**. අර්ථසාධක අරමුදලේ යම් දායකයකුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුගේ හිඥම වැසූ දින සිට මාස තුනක කාලයක් තුළ දී ඔහුට නොගෙවනු ලබන අවස්ථාවක දී, මේ කොටසේ ඉහතින් දැක්වුණු විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ නොතකා සහ වෙනත් යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට අගතියකින් තොරව, ඔහුගේ හිඥමේ බැරට ඇති සම්පූර්ණ මුදලම ඔහුට ගෙවනු ලැබූ මාසයට පෙරාතුව වූ මාසයේ අවසාන දිනය දක්වා කාලයට 32(3) වන වගන්තියේ කාර්ය සඳහා නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයට අනුව ගණන් බලනු ලබන වැල් පොළිය ඒ මුදලට උපචිත විය යුතු ය.

එසේ වුව ද, ඒ මුදල ඒ දායකයාට ගෙවීම ප්‍රමාද වී ඇත්තේ ඒ දායකයාගේ යම් දෝෂයක් නිසා වන අවස්ථාවක දී එවැනි පොළියක් නොගෙවනු ලැබිය යුතු ය.

දායකයාගේ ඇතැම් වත්කම්, තහනමට අල්ලා ගැනීමෙන් හෝ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමෙන් නිදහස් බව.

**36**. මේ පනතේ හැර වෙනත් යම් ලිඛිත නීතියක කවර විධිවිධානයක් තිබුණ ද, දායකයකුගේ බැරට අර්ථසාධක අරමුදලෙහි ඇති මුදල්, යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ විධානයක් හෝ ක්‍රියාවේ යෙදවීමේ ලා තහනමට අල්ලා ගැනීම, තාවකාලිකව තහනමට ගැනීම හෝ තහනම් කිරීම කවර අවස්ථාවක දී වත් නොකළ යුතු ය.

විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවීම.

**37**. මේ කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් පිහිටුවනු ලැබූ අර්ථසාධක අරමුදලට විකල්ප වශයෙන් හෝ ඊට අමතරව හෝ, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු, විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි ය. ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා එහි කළමනාකාරිත්වය සඳහා විශ්ව විද්‍යාලය විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය.

## VIII වන කොටස

### මුදල්

මුදල් වර්ෂය.

**38**. විශ්වවිද්‍යාලයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂයම වන්නේ ය.

39. (1) (මෙහි මින් මතු 'විශ්වවිද්‍යාලීය අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන) බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලීය අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් විශ්වවිද්‍යාලයට තිබිය යුතු අතර, පහත දැක්වෙන මුදල් ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :- විශ්වවිද්‍යාලීය අරමුදල.

(අ) පාර්ලිමේන්තුව විසින් ප්‍රදාන වශයෙන් සපයනු ලබන මුදල් ;

(ආ) කවර ප්‍රභවයකින් වුව ද පරිත්‍යාග වශයෙන් හෝ ප්‍රදාන වශයෙන් විශ්වවිද්‍යාලයට ලැබෙන සියලු මුදල් සහ විශ්වවිද්‍යාලය විසින් සපයනු ලබන සේවා සඳහා අයකරනු ලබන ගාස්තු ;

(ඇ) විශ්වවිද්‍යාලයට අයිති වූ ද කවර ප්‍රභවයකින් වුව ද ලබාගනු ලබන්නා වූ ද වෙනත් සියලු මුදල් ; සහ

(ඈ) රීතිවලට හෝ නියෝගවලට අනුකූලව විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ගාස්තු.

(2) විශ්වවිද්‍යාල අරමුදලට ගෙවනු ලබන එක් එක් මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

40. (1) වාර්ෂික විසර්ජන මගින්, පරිපූරක වැය ශීර්ෂයක් මගින් හෝ අන්‍යාකාරයකින්, පාර්ලිමේන්තුව විසින් ප්‍රදානයක් වශයෙන් සපයනු ලබන මුදල්, එක් එක් මුදල් වර්ෂය ආරම්භවීමෙන් පසු, ප්‍රායෝගික වශයෙන් කළ හැකිතාක් ඉක්මණින්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ය. විශ්වවිද්‍යාලයට ආධාර වශයෙන් දෙනු ලබන ප්‍රදාන.

(2) පෙරාතුව වූ උපවගන්තිය යටතේ විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන සියලු මුදල්, මේ පනතින් බලය දෙනු ලැබූ කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා විශ්වවිද්‍යාලය විසින් යෙදවිය යුතු ය. නැතහොත් වැය කළ යුතු ය.

41. 43 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ පිළියෙල කරන ලද විශ්වවිද්‍යාලයේ ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන, අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති දිනයට පෙර සභාව විසින් සලකා බැලිය යුතු ය. සුදුසු යයි සභාව විසින් සලකනු ලබන වෙනස් කිරීම් සභාව විසින් ඒ ඇස්තමේන්තුවලට සහ විසර්ජනවලට කරනු ලැබිය හැකි අතර, සම්පූර්ණ කරන ලද මුදල් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ගිණුම් ද සමග ඒ ඇස්තමේන්තු සහ විසර්ජන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පාලක සභාව විසින් ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන සලකා බැලිය යුතු බව.

ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන, අමාත්‍යවරයා විසින් සලකා බැලිය යුතු බව.

**42.** විශ්වවිද්‍යාලයේ ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන, අමාත්‍යවරයා විසින් සලකා බැලිය යුතු අතර, සුදුසු යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන පරිදි, ඒ ඇස්තමේන්තු සහ විසර්ජන පිළිගැනීම හෝ ඒවා සංශෝධනය කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

මූල්‍යාධිකාරිවරයාගේ කාර්ය.

**43.** විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරිවරයාගේ කාර්ය පහත දැක්වෙන පරිදි වන්නේ ය :—

(අ) රීති මගින් නියම කර ඇති ආකෘතියට අනුව සහ එසේ නියම කර ඇති ආකාරයට විශ්වවිද්‍යාලයේ ගිණුම් තැබීම ;

(ආ) විශ්වවිද්‍යාලීය අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාරගැනීම සහ ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඈ) ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන ද පරිපූරක ඇස්තමේන්තු කිසිවක් වේ නම් ඒවා ද පාලක සභාව සඳහා පිළියෙල කිරීම:

එසේ වුව ද, නිශ්චිත කාර්ය සඳහා දෙනු ලැබූ ප්‍රදානවලින් හෝ නිශ්චිත පරමාර්ථ සඳහා වූ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම්, විශ්වවිද්‍යාලයේ ගිණුම්වල වෙන වෙනම දැක්විය යුතු අතර, ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග දී ඇත්තේ පිළිවෙළින්, කවර කාර්ය හෝ පරමාර්ථ සඳහා ද ඒ කාර්ය හෝ පරමාර්ථ නොවන, විශ්වවිද්‍යාලයේ පොදු කාර්ය හෝ පරමාර්ථ හෝ සඳහා කිසිදු ගෙවීමක් එකී ආදායම්වලින් නොකළ යුතු ය.

වාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන පාලක සභාව විසින් සලකා බැලිය යුතු බව.

**44.** විශ්වවිද්‍යාලයේ ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික විසර්ජන සහ වාර්ෂික ගිණුම් පාලක සභාව විසින් සලකා බැලිය යුතු අතර, පාලක සභාව විසින් යෝජනා සම්මතයක් මගින්, ඒ ඇස්තමේන්තු සහ විසර්ජන පිළිගැනීම හෝ සුදුසු යයි පාලක සභාව අදහස් කරන පරිදි ඒවා සංශෝධනය කිරීම, නීත්‍යානුකූල වන්නේ ය.

එක් වැය ශීර්ෂයකින් තවත් වැය ශීර්ෂයකට අරමුදල් මාරු කිරීම.

**45.** අවශ්‍ය වන අවස්ථාවල දී, භාණ්ඩාගාරයේ ලිඛිත අනුමතියට යටත්ව, වාර්ෂික ඇස්තමේන්තුවල එක් වැය ශීර්ෂයකින් තවත් වැය ශීර්ෂයකට පාලක සභාව විසින් අරමුදල් මාරු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

46. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ගිණුම් විගණනය කිරීම.

47. (1) කවර වුව ද පළාත් පාලන ආයතනයකට වරිපනම් කිසිවක් ගෙවීමෙන් විශ්වවිද්‍යාලය නිදහස් වන්නේ ය. විශ්වවිද්‍යාලය වරිපනම් වලින් නිදහස් බව.

(2) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද ඒ නොතකා මේ වගන්තියේ විධිවිධාන බලපවත්වන්නේ ය.

48. විශ්වවිද්‍යාලයේ එක් එක් වර්ෂයේ ගිණුම්, විගණනය කරනු ලැබූ කල්හි, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. විගණනය කළ ගිණුම් ප්‍රකාශයට පත් කිරීම.

49. එක් එක් වර්ෂය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව විශ්වවිද්‍යාලයට ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත දී, ඒ වාර්තාව මත පාලක සභාව විසින් කරනු ලැබූ යම් කරුණු දැක්වීමක් වේ නම් ඒවා ද සමග ඒ වාර්තාව ද ඊට අදාළ ගිණුම් ප්‍රකාශය ද පාලක සභාව විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය. වාර්ෂික ගිණුම් සහ විගණකාධිපති-වරයාගේ වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව.

50. (1) පාලක සභාවේ සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්ය සඳහා පත්කරනු ලැබූ විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින්, මේ පනත යටතේ හෝ පාලක සභාවේ විධානය මත හෝ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු පැවරීමක් නොකරනු ලැබිය යුතු ය. සද්භාවයෙන් කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් වගකීමෙන් ආරක්ෂා කිරීම.

(2) විශ්වවිද්‍යාලය විසින් හෝ විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් දරනු ලැබූ යම් වියදමක් විශ්වවිද්‍යාලීය අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී විශ්වවිද්‍යාලයට ගෙවනු ලැබූ හෝ විශ්වවිද්‍යාලය විසින් අයකර ගනු ලැබූ යම් නඩු ගාස්තුවක් විශ්වවිද්‍යාලීය අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ පාලක සභාවේ විධානය පරිදි හෝ කරනු ලැබූ නැතහොත් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්

ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා විසින් දරනු ලැබූ යම් වියදමක් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකර ගෙන ඇත්තේ නම් මිස, ඒ වියදම විශ්වවිද්‍යාලයේ අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

## IX වන කොටස

### නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ කිරීම

විශ්වවිද්‍යාල භූමි භාගය ඇතුළත හෝ ඊට ආසන්නව හෝ පිහිටි ප්‍රදේශවලට 268 වන අධිකාරය අදාළ කිරීම.

**51.** (1) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතෙහි කුමක් සඳහන් වුව ද, විශ්වවිද්‍යාල භූමි භාගය තුළ පහසුකම් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍යානුකූල යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කොට ඇත්තා වූ ද විශ්වවිද්‍යාල භූමි භාගය තුළ හෝ එකී භූමි භාගයට ආසන්නව හෝ පිහිටියා වූ ද එකී ආඥාපනතේ විධිවිධාන අන්‍යාකාරයකින් අදාළ නොවන්නා වූ ද යම් ප්‍රදේශයකට, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් මඳ වෙනස්කිරීම්වලට යටත්ව, ඒ ප්‍රදේශය පළාත් පාලන ආයතනයක සීමා තුළ පිහිටි ප්‍රදේශයක් වූ කලක පරිද්දෙන්, එකී ආඥාපනතේ II වන කොටසේ I වන පරිච්ඡේදය අදාළ වන බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් නියමයක් පළ කරනු ලැබූ විට, පහත සඳහන් වෙනස්කිරීම්වලට යටත්ව, එනම්—

(i) 'සභාපතිවරයා' යන වචනය එහි යම් තැනෙක යෙදේ ද ඒ සෑම තැනකම ඒ වෙනුවට 'මහෝපාධ්‍යායයන් වහන්සේ ' යන වචන ආදේශ කළාක් පරිද්දෙන් ;

(ii) එහි 7 වන වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කළාක් පරිද්දෙන් ;

"විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ විසින්—

(අ) යම් ගොඩනැගිල්ලක යම් සැලැස්මක්, ඇඳීමක් හෝ වැඩ විස්තරයක් අනුමත කිරීම ; හෝ

(ආ) යම් ගොඩනැගිල්ලකට කරනු ලබන යම් වෙනස්කිරීම්වලට කැමැත්ත දීම,

තමාගේ මතය අනුව විශ්වවිද්‍යාල භූමි භාගය තුළ ඇති පහසුකම්වලට හානි කර විය හැකි ස්වාභාවයේ නම් මිස හෝ ඒ අනුමතය හෝ කැමැත්ත ඉල්ලා ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍රය 8 වන වගන්තිය යටතේ වූ යම් නියමයකට අනුකූල නොවන්නේ නම් මිස, එවැනි අනුමත කිරීමක් හෝ කැමැත්ත දීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය."

(iii) එහි 8 වන වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කළාක් පරිද්දෙන් ;—

"(අ) මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නියම කරනු ලබන ආකෘතියෙහි වූ ද එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් වූ ද සැලසුම්, ඇඳීම් හා වැඩ විස්තර ඉදිරිපත් කිරීම ";

(iv) එහි 8 වන වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කළාක් පරිද්දෙන් ;—

"(ආ) එසේ ඉදිරිපත් කරනු ලැබූ යම් සැලැස්මක්, ඇඳීමක් හෝ වැඩ විස්තරයක් ඒ ආකෘතියට අනුකූල වන පරිදි හෝ එකී යම් විස්තරයක් ඇතුළත් වන පරිදි හෝ සංශෝධනය කිරීම " ;

(v) එහි 8 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි "ආඥාපනත" යන වචනය වෙනුවට "මේ පරිච්ඡේදය" යන වචනය ආදේශ කළාක් පරිද්දෙන් ;

(vi) එහි 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කළාක් පරිද්දෙන් ; —

"(ඇ) මේ පරිච්ඡේදයේ කවර වූ හෝ විධිවිධානයන් කඩ කරමින් යම් ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු කිරීම " ;

(vii) එහි 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කළාක් පරිද්දෙන් ; —

"(2) යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකරුවකු කරනු ලැබූ අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින්, මහෝපාධ්‍යායයන් වහන්සේගේ ඉල්ලීම පිට, තම

ආඥාවෙහි සඳහන් නියමිත කාලය ඇතුළත ප්‍රස්තුත ගොඩනැගිල්ල කඩා දැමීමට හෝ විශ්වවිද්‍යාලයේ භූමි භාගයේ ඇති පහසුකම්වලට හානියක් නොවන පරිදි ඒ ගොඩනැගිල්ල වෙනස් කිරීමට, ඒ තැනැත්තාට හෝ ගොඩනැගිල්ලෙහි අයිතිකරුට හෝ ඒ දෙදෙනාටම හෝ නියම කරමින් විධානාත්මක ආඥාවක් කළ හැකි අතර, ඒ විධානාත්මක ආඥාව අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක, ඒ ගොඩනැගිල්ල කඩා දැමීමට, වෙනස් කිරීමට හෝ ආඥාව අනුව ක්‍රියා කිරීම සහතික කෙරෙන ආකාරයට ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අන්‍යාකාරයකට කටයුතු කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට බලය දිය හැකි ය. එසේ කිරීමේ දී දැරීමට සිදුවන වියදම්, මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් අයකර ගන්නා ආකාරයෙන්ම ඔහුගේ ආඥාවක් මත අයකර ගත යුතු අතර, එය, විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ගෙවනු ලැබිය යුතු ය'' ;

(viii) එහි 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කළාක් පරිද්දෙන් ;—

"(1) මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසු ඉදිකරනු ලැබූ ගොඩනැගිල්ලක්, එහි ඉදිරිකිරීම අතින්, ජලාපවහනය අතින් හා අන් සියලු ආකාරයෙන් විශ්ව විද්‍යාලීය භූමි භාගයේ ඇති පහසුකම්වලට හානියක් නොවන බවට මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් සහතිකයක් නිකුත් කරනු ලබන තුරු, ඒ ගොඩනැගිල්ල, භාරකරුවකු විසින් හැර පදිංචියට නොගත යුතු ය ''; සහ

(ix) එහි 16 වන වගන්තියෙහි අභියාචන විනිශ්චය සභාව පිළිබඳ සඳහන ඒ ප්‍රදේශයේ පිහිටියා වූ දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය පිළිබඳ සඳහනක් වන පරිද්දෙන් ;

යන වෙනස්කිරීම්වලට යටත්ව යටකී ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රදේශයකට එකී පරිච්ඡේදය අදාළ වන්නේ ය.

(3) මේ වගන්තියේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත පවරන ලද බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමතයට යටත්ව විය යුතු අතර, විශ්වවිද්‍යාලයේ භූමි භාගය තුළ පහසුකම්වලට හානි සිදුවේය යන හේතුව මත එකී ප්‍රදේශය තුළ යම් ගොඩනැගිල්ලක යම් සැලැස්මක්, ඇදීමක් හෝ වැඩ විස්තරයක් අනුමත කිරීම හෝ යම් වෙනස්කිරීමකට කැමැත්ත දීම මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵල වශයෙන් යම් පාඩුවක් හෝ හානියක් විඳීමට සිදුවන යම් තැනැත්තකුට විශ්වවිද්‍යාලය විසින් වන්දි ගෙවිය යුතු ය. තව ද එසේ වන්දි ගෙවීම හෝ ප්‍රමාණවත් වන්දියක් ගෙවීම හෝ විශ්වවිද්‍යාලය විසින් පැහැර හැරීම නිසා අතෘප්තියට පත්වන යම් තැනැත්තකු විසින් ඒ ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත අභියාචනය කළ හැකි අතර එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ඒ දිසා අධිකරණය දෙන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

## X වන කොටස

### ආණ්ඩුවේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත අදාළ කිරීම

ආණ්ඩුවේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත විශ්ව විද්‍යාලයේ නිල නිවාසවලට අදාළ කිරීම.

**52.** (1) 1969 අංක 7 දරන ආණ්ඩුවේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ ) පනතේ විධිවිධාන:—

(අ) (2) වන උපවගන්තියේ දැක්වෙන මඳ වෙනස්කිරීම්වලට යටත්ව විශ්වවිද්‍යාලයේ නිල නිවාසවලට අදාළ වන්නේ ය ; තව ද

(ආ) විශ්වවිද්‍යාලයේ නිල නිවාසවල පදිංචිය දරන තැනැත්තන් විෂයෙහි පැනවෙන ව්‍යංග කොන්දේසියක් වූ ලෙස සහ වන ලෙස සෑම කල්හිම සලකනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුවේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ විධිවිධාන විශ්වවිද්‍යාලයේ නිල නිවාසවලට අදාළ වීමේ දී—

(i) ඒ පනතෙහි, "ආණ්ඩුවේ නිවාස " යන වචන යම් තැනක යෙදේ ද ඒ වෙනුවට ඒ සෑම තැනකම " විශ්වවිද්‍යාලයේ නිල නිවාස " යන වචන ආදේශ කළාක් මෙන් ;

(ii) එහි 9 වන වගන්තියේ —

(අ) " නියම බලධරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අර්ථකථනය අදාළ කළාක් මෙන්, එනම් —

"නියම බලධරයා" යන්නෙන් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා අදහස් වේ. තව ද

(ආ) එහි "ආණ්ඩුවේ නිවාස" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අර්ථකථනය අදේශ කළාක් මෙන්, එනම් —

"විශ්ව විද්‍යාලයේ නිල නිවාස" යන්නෙන් පදිංචි වීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලය විසින් නැතහොත් එය වෙනුවෙන් සපයනු ලැබ පදිංචිය දරන හෝ භාවිත කරනු ලබන යම් ගොඩනැගිල්ලක්, කාමරයක් හෝ වෙනත් නවාතැනක් අදහස් වන අතර ඒ ගොඩනැගිල්ල, කාමරය හෝ නවාතැන පිහිටි ඉඩම හෝ ස්ථානය ද එයට ඇතුළත් වේ.".

## XI වන කොටස

### පොදු විධිවිධාන

විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක සාමාජිකයන් වීමට නුසුදුසු වීම.

**53**. යම් තැනැත්තකු —

(අ) නිදහස් කරනු නොලැබූ බංකොලොත්කරුවකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වේ නම් ; හෝ

(ආ) චරිත දූෂණාත්මක වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ තිබේ නම් ; හෝ

(ඇ) තත්කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකලව සිටින බව තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ තිබේ නම් ; හෝ

(ඈ) තමාගේ සේවය පිළිබඳ ගිවිසුම හැර විශ්වවිද්‍යාලය විසින් හෝ ඒ වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ, තමා විසින් කෙලින්ම හෝ, තමා වෙනුවෙන් නැතහොත් තම ප්‍රයෝජනය හෝ ප්‍රතිලාභය

පිණිස යම් තැනැත්තකුගේ මාර්ගයෙන් වක්‍රාකාරයෙන් යම් අයිතියක් හෝ ලාභයක් දරයි නම් හෝ භුක්ති විඳී නම්

එවැනි තැනැත්තෙක් විශ්වවිද්‍යාලයේ යම් මණ්ඩලයකට පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු වීමට සුදුස්සෙක් නොවන්නේ ය.

විශ්වවිද්‍යාලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**54.** විශ්වවිද්‍යාලයට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී, විශ්ව විද්‍යාලයේ උත්තරීතර සභාවේ, පාලක සභාවේ හෝ සනාතන සභාවේ යම් සාමාජිකයකුට හෝ විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව නැතහොත් එකී කිසිවකුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

විශ්වවිද්‍යාලයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**55.** විශ්වවිද්‍යාලයේ සියලුම නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව විශ්වවිද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**56.** අල්ලස් පනතේ අර්ථානුකූලව විශ්වවිද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

වෙනත් ආයතන විශ්වවිද්‍යාලයට මාරු කිරීම.

**57.** (1) ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන හා පාලනය කරනු ලබන යම් ආයතනයක්, පාසැලක් හෝ විශ්ව විද්‍යාලයක් එහි ඇති යම් චංචල දේපළක් සමග, අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් විශ්වවිද්‍යාලය වෙත පැවරිය හැකි අතර ඒ ආයතනයේ, පාසැලේ හෝ විද්‍යාලයේ යම් නිශ්චල දේපළ, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් කරනු ලබන පවරාදීම නියමයක් මගින් විශ්වවිද්‍යාලය වෙත සතු කර දෙනු ලැබිය හැකි ය.

(2) එවැනි නියමයක් පළ කරනු ලැබීමෙන් පසු ඒ ආයතනයේ, පාසැලේ හෝ විද්‍යාලයේ චංචල හා නිශ්චල දේපළ ඒ නියමයේ නිශ්චිතව සඳහන් දින සිට විශ්වවිද්‍යාලය සතු වන්නේ ය.

## XII වන කොටස

## විවිධ විධිවිධාන

විශ්වවිද්‍යාලයේ භූමි භාගය තුළ පදිංචිය සීමා කිරීම.

**58**. පහත සඳහන් තැනැත්තකු නොවන, එනම්,—

(අ) භික්ෂුන් වහන්සේ නමක්: හෝ

(ආ) විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයක සේවකයකු නොවන කිසිදු තැනැත්තකු විශ්වවිද්‍යාලයේ භූමි භාගය තුළ පදිංචි වී නොසිටිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ භූමිභාගය තුළට නුසුදුසු තැනැත්තන්ට ඇතුළුවීම තහනම් කිරීම.

**59**. (1) විශ්වවිද්‍යාල භූමි භාගයට යම් තැනැත්තකු පැමිණ සිටීම, පාලක සභාවේ මතය අනුව නුසුදුසු වන අවස්ථාවක, කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට අවස්ථාවක් සලස්වා දීමෙන් පසු මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පාලක සභාවේ කැමැත්ත ඇතිව, ඒ තැනැත්තා වෙත භාර දෙනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින්, ඒ තැනැත්තා ඒ භූමි භාගයට හෝ ඒ ලිපියේ නිශ්චිතව සඳහන් යම් කොටසකට ඇතුල්වීම හා එහි නතරව සිටීම තහනම් කළ හැකි ය. ඒ තහනම මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පාලක සභාවේ කැමැත්ත ඇතිව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් බලපවත්වන්නේ ය.

(2) තම සහතිකයේ නම් කර ඇති යම් තැනැත්තකු විශ්ව විද්‍යාලයේ භූමි භාගයට හෝ එහි නිශ්චිතව සඳහන් කොටසකට ඇතුල්වීම හෝ එහි නතරව සිටීම (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව තහනම් කර ඇති බවට මහෝපාධ්‍යායයන් වහන්සේගේ අත්සන යටතේ වූ සහතිකයක්, ඒ සහතිකයේ ප්‍රකාශ කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන්, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, සාක්ෂි වශයෙන් කවර වුව ද අධිකරණයක් විසින් භාර ගැනීම හා පිළිගැනීම කළ යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නිකුත් කරනු ලැබූ හා උන්වහන්සේ අත්සන් කරනු ලැබූ සහතිකයක් ලෙස උද්දේශිත ලේඛනයක් සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, එය මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) විශ්වවිද්‍යාල භූමි භාගයට හෝ එහි යම් කොටසකට ඇතුල්වීම හෝ එහි නතරවී සිටීම (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තහනම් කරනු ලැබූ තැනැත්තකු, ඒ තහනම

උල්ලංඝනය කරමින්, සෑහෙන හේතුවක් නොමැතිව ඒ භූමි භාගයට හෝ එහි කොටසකට ඇතුල් වුවහොත් හෝ එහි නතරවී සිටියහොත් හෝ, ඔහු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට ඒ භූමි භාගයට හෝ එහි කොටසකට හෝ ඔහු ඇතුළු වුණු හෝ එහි නතර වී සිටි එක් එක් දිනය හෝ ඉන් කොටසක් හෝ සම්බන්ධයෙන් රුපියල් සියයක දඩයකට ඔහු යටත් වන්නේ ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ වරදක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංජ්ඥෙය වූ ද ඇප දිය හැකි වූ ද වරදක් වන්නේ ය.

60. (1) විශ්වවිද්‍යාලයේ උත්තරීතර සභාව විසින් පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් නියමාවලි සාදනු ලැබිය හැකි ය :— නියමාවලි.

(අ) අන්‍යාකාරයකින් විධිවිධාන සලසා නොමැති අවස්ථාවක විශ්වවිද්‍යාලයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක පුරප්පාඩු පිරවීම හා යම් බල මණ්ඩලයක් හෝ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් කැඳවීම :

(ආ) විශ්වවිද්‍යාලය විසින් පිරිනැමිය යුතු උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම :

(ඇ) විශ්වවිද්‍යාලයේ සම්මාන උපාධි පිරිනැමීම :

(ඈ) තත්කාර්ය සඳහා කවරාකාරයකින් හෝ සපයනු ලබන මුදල්වලින් හෝ දේපළවලින් අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ආධාර ශිෂ්‍යත්ව හා ත්‍යාග ඇතිකිරීම හා ප්‍රදානය කිරීම ;

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ නියමාවලි සෑදීමට බලය දී ඇති හෝ නියම කර ඇති සියලු කාරණා.

(2) උත්තරීතර සභාව විසින් අනුමත කරනු ලැබූ විට සෑම නියමාවලියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එහි සඳහන් දිනයක සිට ඒ නියමාවලි බලාත්මක වන්නේ ය.

අතුරු ව්‍යවස්ථා.

61. (1) විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :—

(අ) විශ්වවිද්‍යාලයේ සියලුම උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා නියම කරනු ලබන අධ්‍යයන පාඨමාලා:

(ආ) විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා නියම කරනු ලැබූ අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට ශිෂ්‍යයන් ඇතුළු කර ගත යුත්තේ හා ඒ ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබිය යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි :

(ඇ) අධ්‍යයන පාඨමාලා, විභාග හා නිවාස සඳහා ද උපාධි, අභිඥාන පත්‍ර, සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනමනු ලැබීම සඳහා ද අය කළ යුතු ගාස්තු :

(ඈ) ශිෂ්‍යයන්ගේ පදිංචිය පිළිබඳ කොන්දේසි :

(ඉ) අන්‍යාකාරයක විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ සාමාජිකත්වය පිළිබඳ නියමයන් :

(ඊ) විශ්වවිද්‍යාලයේ විවිධ බල මණ්ඩලවලට හා වෙනත් පුද්ගල මණ්ඩලවලට නියෝජිතයන් තෝරා පත්කර ගැනීමට සම්බන්ධ සියලු කාරණා :

(උ) පරීක්ෂකවරයන් පත් කිරීමේ කොන්දේසි හා ක්‍රමය, ඔවුන්ගේ කාර්ය හා පඩිනඩි සහ විභාග පැවැත්වීම හා විභාගවල උසස් තත්ත්වයන් පවත්වා ගෙන යාම :

(ඌ) අතුරු ව්‍යවස්ථා සෑදීමට මේ පනත යටතේ හෝ, මේ පනත යටතේ සාදන ලද නියමාවලිවල විධිවිධාන යටතේ හෝ, බලය පැවරී ඇති හෝ නියමිතව ඇති සියලු කාරණා.

(2) විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමට හෝ විභාගවලට හෝ අදාළ නැතහොත් ඒවාට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් කිසිදු අතුරු ව්‍යවස්ථාවක්, විශ්වවිද්‍යාලයේ සනාතන සභාව

විසින් පිළියෙළ කොට පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත්නම් මිස, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් එවැනි කිසිදු අතුරු ව්‍යවස්ථාවක් නොසෑදිය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවක් එහි නිශ්චිතව සඳහන් දිනයක සිට වලංගු වන්නේ ය.

62. යම් ශාස්ත්‍රීය කරුණක් සඳහා සහ එවකට බලපවත්නා නියෝගයක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා, විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. මේ වගන්තියෙහි "අධ්‍යයන කරුණ" යන්නෙන් සනාතන සභාවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කරුණක් අදහස් වේ. නියෝග.

63. (1) විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් පහත දැක්වෙන කරුණු සඳහා රීති සාදනු ලැබිය හැකි ය :— රීති.

(අ) මේ පනතේ විධිවිධාන යටතේ, රීති මගින් නියම කළ යුතු හෝ නියම කළ හැකි සියලු කාරණා සඳහා ;

(ආ) මේ පනතේ හෝ යම් උචිත සාධන පත්‍රයක හෝ විධිවිධාන යටතේ රීති සෑදීමට නියමිතව හෝ බලය පැවරී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා සඳහා ; සහ

(ඇ) හුදෙක් විශ්වවිද්‍යාලයේ ඒ බල මණ්ඩලයට හෝ පුද්ගල මණ්ඩලයට අදාළ වූත් මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් විධිවිධාන සලස්වා නැත්තා වූත් සෙසු සියලු කාරණා සඳහා.

(2) යම් බල මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින් සාදනු ලැබූ යම් රීතියක්, ඒ බල මණ්ඩලය හෝ ඒ වෙනත් පුද්ගල මණ්ඩලය විසින් සාදනු ලබන රීතියක් මගින්, සංශෝධනය කිරීම, එයට යමක් එකතු කිරීම, එය වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

64. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ, විධිවිධාන, මේ පනතින් පිහිටුවනු ලබන විශ්වවිද්‍යාලයට හෝ එය සම්බන්ධයෙන් හෝ අදාළ නොවන්නේ ය. 1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවන බව.

## XIII වන කොටස

### ඉවත් කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන

1968 අංක 16 දරන පනත ඉවත් කිරීම.

**65.** 1968 අංක 16 දරන බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය පනත, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

1968 අංක 16 දරන පනත ඉවත් කිරීමේ ප්‍රතිඵලය.

**66.** මේ පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත්ව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට පහත දැක්වෙන විධිවිධාන ආදාළ වන්නේ ය.

(1) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට පෙර දිනයෙහි බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයේ සේවයේ නියුක්තව සිටියා වූ ද බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයේ රැකියා අවස්ථා ලබා නොදෙන ලද්දා වූ ද සියලුම ආචාර්යවරුන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් ලබා ගැනීමේ හිමිකම ඇත්තේ ය.

(2) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට පෙර බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක නැතහොත් විනිශ්චය අධිකාරයක පවරනු ලැබ ඇති සියලුම සිවිල් හෝ අපරාධ නඩු, අභියාචන හෝ වෙනත් නඩු කටයුතු, අවස්ථාවෝචිත පරිදි, එදින සිට බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය විසින් හෝ එයට විරුද්ධව හෝ පවරනු ලැබ ඇති ලෙස සැලකිය යුතු ය.

(3) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට කලින්, බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයට විරුද්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයට පක්ෂව හෝ විරුද්ධව කරනු ලැබූ තීන්දු හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි දී බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය වෙත සතු කර දී තිබුණු හෝ බදු දී තිබුණු හෝ

ඊට කැමැත්තක් කර ගැනීමට දී තිබුණු හෝ බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය සඳහා භාරයක් වශයෙන් දරා තිබුණු හෝ එය සන්තකව නැතහොත් එහි පාලනය යටතේ තිබුණු චංචල සහ නිශ්චල සියලු දේපළ, එදිනට ඒ දේපළවලට අයත්ව තිබුණු, අනුබද්ධව තිබුණු හෝ අදාළව තිබුණු නියමයන් සහ කොන්දේසි මතම සහ එදිනට පැවති භාරවලට, ගාස්තුවලට, බැරකම්වලට වෙන් කර තැබීම්වලට, පරවශතාවලට හෝ වෙනත් බැඳීම්වලට යටත්ව, බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය විසින් හෝ එය සඳහා භාරයක් වශයෙන් හෝ දැරිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**67.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## XIV වන කොටස

### අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය.

**68.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"අතුරු ව්‍යවස්ථාව" යන්නෙන්, මේ පනත යටතේ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථාවක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, ඉටු කරනු ලබන සහ සිදු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇති කරනු ලැබූ නැතහොත් පිහිටුවනු ලැබූ යම් බලාධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"නියමාවලිය" යන්නෙන්, විශ්වවිද්‍යාලය විසින් සාදන ලද යම් නියමාවලියක් අදහස් වේ ;

"නියෝගය" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් සාදන ලද යම් නියෝගයක් අදහස් වේ ;

"රීතිය" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ බල මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින් සාදන ලද රීතියක් අදහස් වේ ;

"ආචාර්යවරයා" යන්නෙන්, මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, කථිකාචාර්යවරයෙක් සහ සහකාර කථිකාචාර්යවරයෙක් හා යම් තනතුරක් දරන්නකු ආචාර්යවරයකු වශයෙන් සැලකිය යුතු බවට, නියමාවලි මගින් ප්‍රකාශ කොට ඇත්තේ ද එවැනි තනතුරක් දරන්නෙක් අදහස් වේ ; සහ

"සභාව" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ.